# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2360/22 - 2023 නොවැම්බර් මස 27 වැනි සඳුදා - 2023.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 19/78 (VII)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වන වගන්තිය සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ආචාර්ය **විජයදාස රාජපක්ෂ,**
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2023 අංක 3 දරන සාමදාන විනිශ්චයකාරවරයන් (පත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම, සහ ආචාර ධර්ම පද්ධතිය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. යම් තැනැත්තකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු වශයෙන් පත් කරනු ලැබීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලිය යුතු ය.

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම,

(ආ) වයස අවුරුදු තිහට නොඅඩු තැනැත්තකු වීම,

(ඇ) යහපත් චරිතයකින් යුක්ත, අවිවාදිත අවංකභාවයකින් යුක්ත සහ තම ප්‍රජාව විසින් හෝ රටේ ජනතාව විසින් ගරු කරනු ලබන සහ විශ්වාසය තබන ලද තැනැත්තකු වීම,

(ඈ) රාජ්‍ය භාෂාවන්ගෙන් එක් භාෂාවක් චතුර ලෙස කතා කිරීමේ, කියවීමේ සහ ලිවීමේ හැකියාව ඇති තැනැත්තකු වීම.


1A - G 40867 — 26 (2023/11)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඉ) (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ, කලින් කලට, වෙනස් කරනු ලැබිය හැකි පරිදි වූ රුපියල් දසදහසක් නොඉක්ම වූ දඩයක් නියම කරනු ලැබිය යුතු වරදකට හැර වෙනත් යම් අපරාධ චෝදනාවකට අධිකරණයක දී වරදිකරුවකු නොවූ තැනැත්තකු වීම,

(ඊ) බුන්වත් පත් නොවූ තැනැත්තකු වීම,

(උ) ප්‍රජාවට මනා සේවයක් ලබා දුන් තැනැත්තකු වීම,

(ඌ) යහපත් ශාරීරික සහ මානසික තත්වයෙන් යුක්ත අයකු වීම, සහ

(එ) අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ විෂයන් තුනකින් සමත්ව තිබිය යුතු අයකු වීම,

කෙසේ වුව ද, විශේෂ අවස්ථාගත කරුණුවල දී, විෂයන් තුනක් සමත්ව නොමැති හෝ අ. පො. ස උසස් පෙළ සුදුසුකම සපුරා නොමැති තැනැත්තකු වුව ද, ඔහු විසින් යම් නිශ්චිත ක්ෂේත්‍රයක් තුළ ලබා ගත් නිශ්චිත කුසලතාවක් හෝ අත්දැකීමක් ප්‍රකාරව සමාජයට ලබාදුන් අනුපමේය සේවය සලකා බලා, එකී තැනැත්තා සාමදාන විනිශ්චයකාර තනතුර පිරිනැමීම සඳහා සුදුසු බවට අමාත්‍යවරයාගේ මතය වන්නේ නම්, අමාත්‍යවරයා විසින් ලිඛිතව හේතු දක්වමින් ඔහුට එකී තනතුර පිරිනමනු ලැබිය හැකි ය ; සහ

(ඒ) සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් මීට පෙර දී ලද පත්වීම අවලංගු කරනු ලැබ නොමැති හෝ අවසන් කරනු ලැබ නොමැති තැනැත්තකු වීම.

3. සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් පත්කරනු ලැබීමට සුදුසුකම් ඇති තැනැත්තකු විසින් තම ඉල්ලීම ලිඛිතව අමාත්‍යවරයා වෙත යොමු කළ හැකි ය. අමාත්‍යවරයාට, නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් ලැබීම මත, සාමදාන විනිශ්චයකාරවරයකු වීම සඳහා යම් තැනැත්තකු පත් කරනු ලැබීමට හැකි ය.

4. සාමදාන විනිශ්චයකාරවරයකු ලෙස පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, එකී තැනැත්තාගේ ධුරයෙන් ඉල්ලා අස්වීම, මියයාම හෝ අමාත්‍යවරයා විසින් ඔහුගේ පත්වීම අත්හිටුවීම, අවලංගු කිරීම හෝ අවසාන කිරීම මත ධුරය හිස් කරනු ලබන්නේ නම් මිස, ජීවිත කාලය පුරාවට ම සාමදාන විනිශ්චයකාරවරයකු ලෙස ධුරය දරනු ලැබිය හැකි ය.

5. ලේකම්වරයා විසින්, පහත සඳහන් විස්තර ඇතුළත් සාමදාන විනිශ්චයකාරවරයන්ගේ ලේඛනයක් ලෙස සඳහන් ලියාපදිංචි ලේඛනයක් පවත්වාගෙන යා යුතුයː-

(අ) සම්පූර්ණ නම ;

(ආ) උපන් දිනය ;

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය ;

(ඈ) පදිංචි ලිපිනය සහ දුරකතන අංක (ජංගම සහ ස්ථාවර) ;

(ඉ) පත්වීමේ දිනය, ලියාපදිංචි අංකය සහ අධිකරණ බලප්‍රදේශය ; සහ

(ඊ) සාමදාන විනිශ්චයකාර ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ධුරය අත්හිට වූ 8 වන නියෝගය ප්‍රකාරව අවලංගු කළ හෝ අවසන් කළ දිනය ;

(උ) මිය ගිය දිනය.

6. (1) 5 වන නියෝගය යටතේ ලේඛනය යාවත්කාලීන කිරීමේ කාර්යය සඳහා, සෑම සාමදාන විනිශ්චයකාරවරයකු විසින් ම, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයට අනුකූලව අදාළ ග්‍රාම නිළධාරියා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කරන ලද ජීවන සහතිකයක්, සෑම වසර දෙකකට වරක් ම මාර්තු මස තිස් එක් වන දින හෝ එදිනට පෙරාතුව ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු යː

කෙසේ වුව ද, මෙම නියෝග බලාත්මක වීමට පෙරාතුව සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් පත්කරනු ලැබූ සෑම තැනැත්තකු විසින් ම, මේ නියෝග බලාත්මක කරනු ලැබීමේ දිනය සිට වසරක කාලයක් ඇතුළත අදාළ ග්‍රාම නිළධාරියා විසින් සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කරන ලද ජීවන සහතිකයක් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, සාධාරණ බවට සලකනු ලබන හේතු මත හැර, එකී ජීවන සහතිකය ඉදිරිපත් කිරීම පැහැර හරින සෑම සාමදාන විනිශ්චයකාරවරයකු ම, එකී සහතිකය ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ අවසන් දිනයේ සිට ධුරයෙන් ඉල්ලා අස් වූ බවට සලකනු ලැබිය යුතු ය.

7. සෑම සාමදාන විනිශ්චයකාරවරයකු විසින් ම, මේ නියෝගවල II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සාමදාන විනිශ්චයකාරවරුන් සඳහා වන ආචාරධර්ම පද්ධතියේ විධිවිධාන පිළිපැදිය යුතු අතර, එසේ කිරීම පැහැර හැරීම, පිරිනමන ලද තනතුරේ විෂමාචාර ක්‍රියාවක් විය යුතු අතර, අමාත්‍යවරයා විසින් ස්වකීය අත්සන යටතේ වන ලිඛිත දැන්වීමක් මඟින් සාමදාන විනිශ්චයකාර ධුරයෙන් ඉවත් කිරීමකට යටත් විය යුතු ය.

8. සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් පත්කරන ලද තැනැත්තකු විසින් :-

(අ) පත්වීම ලබා මාස තුනක් ඇතුළත දිවුරුම් දීම පැහැර හරින ;

(ආ) ඔහුගේ පත්වීමට අදාළ යම් කොන්දේසියකට අනුකූලවීම පැහැර හරින ;

(ඇ) යම් අපරාධ චෝදනාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ වරදකරු වන ;

(ඈ) බුන්වත් බවට යම් අධිකරණයක් විසින් ප්‍රකාශ කරනු ලබන ;

(ඉ) ධුරයේ කර්තව්‍ය සිදුකරගෙන යාම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය නොවන බව සොයා දැනගනු ලබන ;

(ඊ) ස්වකීය අධිකාරිය අයුතු ලෙස භාවිතා කිරීමට වරදකරු වන ;

(උ) 7 වන නියෝගය යටතේ නිශ්චිතව දක්වා ඇති සාමදාන විනිශ්චයකාරවරයන් සඳහා වන ආචාර ධර්ම පද්ධතියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමෙන් විෂමාචාර ක්‍රියාවකට වරදකරු වන බව සොයා දැනගනු ලබන.

අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් සාමදාන විනිශ්චයකාර පත්වීමක් අවලංගු හෝ අවසන් කරනු ලැබිය හැකිය.

9. සාමදාන විනිශ්චයකාරවරයකුට තත්කාර්ය සඳහා අමාත්‍යවරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම මඟින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

10. සාමදාන විනිශ්චයකාරවරයකුගේ ධුරයට පත්කිරීම අවලංගු කිරීම සඳහා වන කාර්ය පටිපාටිය පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) සාමදාන විනිශ්චයකාරවරයකු විසින් 8 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් ක්‍රියාවක් හෝ උල්ලංඝනය කිරීමක් සිදුකරනු ලැබ ඇති බවට යම් තොරතුරක්, පැමිණිල්ලක් හෝ චෝදනාවක් ලේකම්වරයා වෙත ලැබීම මත, ලේකම්වරයා විසින් චෝදිත ක්‍රියාව හෝ උල්ලංඝනය කිරීම වටා ඇති සියලු ම අවස්ථාගත කරුණු විමර්ශනය කිරීමට සැලැස්විය යුතු ය ;

(ආ) (අ) ඡේදය යටතේ විමර්ශනයක් පවත්වනු ලැබිය යුතු අවස්ථාවක දී, අමාත්‍යවරයාට, එකී විමර්ශනයේ නිගමනය සිදුකරන තෙක්, එකී තැනැත්තා විසින් සාමදාන විනිශ්චයකාරවරයාගේ ධුරය දැරීම අත්හිටුවිය හැකිය ;

(ඇ) (අ) ඡේදය යටතේ වන විමර්ශනයේ අනාවරණය කරගත් කරුණු ලැබීම මත, ලේකම්වරයා විසින් අනාවරණය කරගත් කරුණු සහ ස්වකීය නිර්දේශ අමාත්‍යවරයා වෙත යැවිය යුතු ය. අමාත්‍යවරයා විසින්, ලේකම්වරයාගේ අනාවරණය කරගත් කරුණු සහ නිර්දේශ සලකා බලා තීරණයක් ගත යුතු ය.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල :-

"ලේකම්වරයා" යන්නෙන්, අධිකරණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්වරයා අදහස් වන අතර, එකී ලේකම්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද යම් අතිරේක ලේකම්වරයකු ද ඊට ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, අධිකරණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ.

1 වන උපලේඛනය

[6 වන නියෝගය]

**ජීවන සහතිකය**

.........................(වර්ෂය)

**සාමදාන විනිශ්වයකාරවරුන් සම්බන්ධ නියෝග (පත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම පද්ධතිය)**

සාමදාන විනිශ්වයකාරවරුන් සඳහා උපදෙස් ඃ

1. මෙම සහතිකය, ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ සිට වර්ෂ දෙකකින් කල් ඉකුත් වේ.
2. සම්පූර්ණ ආකෘති පත්‍රය පිරවීමට කාරුණික වන්න.
3. අත්සන සහ නිල මුද්‍රාව සම්පූර්ණ බවට සහතික කිරීමට කාරුණික වන්න. නොඑසේ නම් සහතිකය ප්‍රතික්ෂේප වනු ඇත.
4. ජාතික හැඳුනුම්පතෙහි/විදේශ ගමන් බලපත්‍රයෙහි යම් වෙනසක් සිදුවුවහොත්, අදාළ පිටපත් අමුණා ඉදිරිපත් කළ යුතු ය.
5. ද්විවාර්ෂිකව, මාර්තු 31 වන දිනට පෙරාතුව සහතිකය එවීම පැහැර හැරීම, 6(2) නියෝගයට අනුව සාමදාන විනිශ්වයකාර ධුරයෙන් ඉල්ලා අස්වීම වශයෙන් සලකනු ලැබිය යුතු ය.

1. **කාර්යාලයීය තොරතුරු ඃ**

    1.1 ලියාපදිංචි අංකයඃ ...................................................................

    1.2 පත්වීමේ දිනයඃ ....................................................................

    1.3 අධිකරණ බල ප්‍රදේශයඃ .........................................................

2. **පෞද්ගලික තොරතුරු ඃ**

    2.1. සම්පූර්ණ නම (ඉංග්‍රීසි) ඃ- ....................................................................................................................................

    2.2. සම්පූර්ණ නම (සිංහල/දෙමළ) ඃ- ........................................................................................................................

    2.3. ඔබගේ නම වෙනස් වී තිබේද ? ඃ-ඔව්/නැත වෙනස් වී තිබේ නම්,

        2.3.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි) ඃ- .......................................................................................................................

        2.3.2 සම්පූර්ණ නම (සිංහල/දෙමළ) ඃ- ...........................................................................................................

    2.4. උපන් දිනය ඃ- ..............................................

    2.5. ස්ථිර ලිපිනය ඃ- ........................................................................................................................................

    2.6. තාවකාලික ලිපිනය, තිබේනම් ඃ- ............................................................................................................

    2.7. සම්බන්ධ කරගැනීමේ විස්තර ඃ-

        2.7.1. ජංගම ඃ .................................... ස්ථාවර ඃ ...........................................

        2.7.2. විද්‍යුත් තැපැල් ලිපිනය ඃ ..........................................................................................................

3. **හඳුනාගැනීමේ තොරතුරු :**

3.1 ජාතික හැඳුනුම්පත් අංකය : ........................................................................................................

3.2 පුරවැසි කාඩ්පත : ....................................................................

3.3 විදේශ ගමන් බලපත්‍ර අංකය (තිබේ නම්)

| *විදේශ ගමන් බලපත්‍ර අංකය* | *නිකුත්කළ දිනය* | *ඉකුත්වන දිනය* | *නිකුත්කළ රට* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

4. **ප්‍රකාශය :**

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනුමට අනුව සත්‍ය සහ නිවැරදි බව මම මෙයින් ප්‍රකාශ කර සිටින අතර, මා විසින්, ලේඛන පිටපත් අවශ්‍ය පරිදි මේ සමග අමුණා ඇත.

........................................................ ......................................
සාමදාන විනිශ්චයකාරවරයාගේ අත්සන දිනය

5. **සහතික කිරීම :**

5.1 ග්‍රාම නිලධාරිවරයාගේ සහතිකය

ලියාපදිංචි අංක ............................ යටතේ සාමදාන විනිශ්චයකාර ධුරය දරන ..................................... මයා/මිය/පූජ්‍ය/ආචාර්ය මා විසින් දැක ඇති බවටත්, මේ දිනය වනවිට ඔහු /ඇය ජීවත්ව සිටින බවටත්, ධුරයේ කර්තව්‍ය සිදුකරගෙන යාම සඳහා බැලූ බැල්මට පෙනෙන ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් පසුවන බවටත් සහතික කරමි.

................................................ ........................................
ග්‍රාම නිලධාරියාගේ අත්සන මුද්‍රාව

දිනය : ........................................

5.2. ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතිකය අනුමත කිරීම

සාමදාන විනිශ්චයකාරවරයා ජීවත්ව සිටින බවට සහ ධුරයේ කර්තව්‍ය සිදු කරගෙන යාම සඳහා බැලූ බැල්මට පෙනෙන ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් පසුවන බවට වන ග්‍රාම නිලධාරිවරයාගේ සහතිකය, මම අනුමත කරමි.

............................................................ ...........................................
ප්‍රාදේශීය ලේකම්වරයාගේ අත්සන මුද්‍රාව

දිනය : ........................................

## II වන උපලේඛනය

[7 වන නියෝගය]

### සාමදාන විනිශ්චයකාරවරුන් සඳහා වන ආචාරධර්ම පද්ධතිය

මෙම ආචාරධර්ම පද්ධතියේ අරමුණ වන්නේ සාමදාන විනිශ්චයකාරවරුන් අතර සදාචාරාත්මක සහ ආචාරධර්මීය හැසිරීම ප්‍රවර්ධනය කිරීම මගින් ඵලදායී ලෙස යුක්තිය පසිඳලීම ක්‍රියාත්මක කිරීම සහ දූෂිත භාවිතයන් සඳහාවන අවස්ථාවන් තුරන් කිරීම ය.

1. **සේවයට ප්‍රවේශවීම**

සාමදාන විනිශ්චයකාරවරයකු විසින්, අභිමානයෙන් සහ ගෞරවයෙන් යුතුව සාමදාන විනිශ්චයකාරවරයකුගේ සේවා සපයනු ලැබිය යුතු අතර, සේවා සඳහා වන ඉල්ලීම් සම්බන්ධයෙන් කාලෝචිතව කටයුතු කළයුතු අතර, සාමදාන විනිශ්චයකාරවරයකුගේ සේවා සැපයීම අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

2. **කාර්ය සහ කර්තව්‍ය**

2.1 සෑම සාමදාන විනිශ්චයකාරවරයකු විසින් ම පහත දැක්වෙන කරුණු ඉටු කළ යුතු ය :-

(i) පහත දැක්වෙන කොන්දේසිවලට අනුකූලව, ලේඛන සහතික කිරීම සහ නිවැරදි බවට තහවුරු කිරීම සඳහා අදාළව මහජනතාවට සේවය කිරීම :-

(අ) ඔහු විසින් අත්සන් කරනු ලබන ලේඛනයේ මුලකුරු සහිත සම්පූර්ණ නම, අත්සන, දිනය සමග ඔහුගේ ලියාපදිංචි අංකය පැහැදිලිව වාර්තා කළ යුතු ය.

(ආ) මුල් ලේඛනය ඉදිරිපත් කරනු ලැබ ඇත්නම් සහ ලේඛනය අත්සන් කරනු ලබන තැනැත්තාගේ අනන්‍යතාවය පිළිබඳව සෑහීමකට පත්වන්නේ නම් මිස, කිසිදුවිටක ලේඛනයක් සහතික නොකළ යුතු ය.

(ඇ) ප්‍රකාශයක් හෝ සාධන පත්‍රයක් සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරිපිට අත්සන් කිරීමට නියම කරනු ලැබ ඇති අවස්ථාවක දී, එය තමා ඉදිරිපිට සිදු කරනු ලබන බවට තහවුරු කළ යුතු ය, සහ

(ඈ) ඔහුගේ දැනුමට අනුව, වංචනික සහ සාවද්‍ය තොරතුරු ඇතුළත් යම් ලේඛන, දිවුරුම් ප්‍රකාශ සම්බන්ධයෙන් සාක්ෂි දැරීම, සහතික කිරීම, නිවැරදි බවට ප්‍රකාශ කිරීම හෝ අත්සන් කිරීම නොකළ යුතු ය.

(ii) සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් ස්වකීය තත්ත්වයෙන් නීති උපදෙස් ලබාදීම සිදු නොකළ යුතු ය.

(iii) විශේෂයෙන් ම, 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය පනත, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත, (23 වන අධිකාරය වූ) දිවුරුම් සහ සහතික කිරීමේ ආඥාපනත සහ (24 වන අධිකාරය වූ) දිවුරුම් ප්‍රකාශ ආඥාපනත වැනි ශ්‍රී ලංකාවේ බලපවත්නා නීති පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට උත්සාහ දැරිය යුතු ය.

2.2 ස්වකීය ධුරයේ කාර්ය සිදුකිරීමේ දී, සාමදාන විනිශ්චයකාරවරයකු විසින් -

(i) ධුරයේ ප්‍රතිඥාව පිළිපැදිය යුතු ය ;

(ii) සේවා සැපයීම සඳහා ගාස්තුවක් අය කිරීම හෝ යම් ත්‍යාගයක් භාරගැනීම සිදු නොකළ යුතු ය ;

(iii) උපරිම හැකියාවෙන් වෘත්තීමය මට්ටමෙන්, සාධාරණව, උනන්දුවෙන් සහ කඩිනම්ව ක්‍රියා කළ යුතු ය ;

(iv) අවංකව සහ ස්වාධීනව ක්‍රියා කළ යුතු ය ;

(v) වංචනික හෝ නීති විරෝධී ක්‍රියාකාරකම්වල නිරත නොවිය යුතු ය ;

(vi) ධුරය අපකීර්තියට පත්වීම, මහජන අවමානයට ලක්වීම හෝ මහජන ගර්හාව ඇතිවීම සිදුවිය හැකි අන්දමේ, සාමදාන විනිශ්චයකාර ධුරය කෙලෙසන ආකාරයට හැසිරීමෙන් වැළකිය යුතු ය;

(vii) අශ්ශීලතාවයෙන් හෝ අශ්ශීලතාවය පෙන්නුම් කෙරෙන ආකාරයෙන් වැළකී සිටිය යුතු ය ;

(viii) සෑම අවස්ථාවකදී ම මහජන යහපත පිණිස කටයුතු කළ යුතු අතර සාමදාන විනිශ්චයකාරවරයකුගේ සේවා සැපයීමේ දී ස්වාධීනව සහ අපක්ෂපාතීව කටයුතු කළ යුතු ය ;

(ix) සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් තමා සම්බන්ධ වූ යම් කරුණකදී බැඳියාවන් අතර ගැටීමක් නිර්මාණය කරනු ලැබිය හැකි යම් බැඳියාවක් හෝ සම්බන්ධතාවක් හෙළිදරව් කළ යුතු ය ;

(x) සාමදාන විනිශ්චයකාරවරයාගේ පෞද්ගලික පවුල සම්බන්ධ මූල්‍යමය හෝ ව්‍යාපාරික බැඳියාවන් සම්බන්ධව කරුණුවල දී සේවා සැපයීම ප්‍රතික්ෂේප කළ යුතු ය ;

(xi) යම් ව්‍යාපාරයක දී, වාණිජ හෝ පෞද්ගලික ගණුදෙනුවක දී හෝ ආරවුලක දී තම අභිමතාර්ථයන් ඉටුකර ගැනීමට හෝ ඒ වෙනුවෙන් පෙනී සිටීමට යම් විශේෂ බලතලයක්, විශ්වසනීයත්වයක් හෝ තත්ත්වයක් තමන්ට ඇති බව කියා සිටීමට හෝ ඒ බව ඇඟවීමට සාමදාන විනිශ්චයකාර ධුරයේ විරුදනාමය භාවිතා නොකළ යුතු ය ;

(xii) වයස, ස්ත්‍රී පුරුෂභාවය, ජාතිය, වර්ණය, ආගම, සංස්කෘතිය, සමාජ පන්තිය, භාෂාව, මානසික හෝ ශාරීරික හැකියාව හෝ දේශපාලන මතය නොසලකා ධුරයේ ගරුත්වයට ගැලපෙන පරිදි සන්සුන්ව සහ ආචාරශීලීව ක්‍රියා කළ යුතු ය ;

(xiii) සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් ස්වකීය ධුරය ප්‍රකාරව තමාට දැනගැනීමට ලැබෙන තොරතුරුවල රහස්‍යභාවය, තොරතුරුවල සහ යම් පුද්ගලයකු පිළිබඳ විස්තරවල පෞද්ගලිකත්වය සුරක්ෂිත කළ යුතු අතර, නීතියෙන් නියම කරනු ලබන පරිදි හැර එකී තොරතුරු හෙළිදරව් නොකළ යුතු ය ; සහ

(xiv) සාමදාන විනිශ්චයකාර විරුදනාමය භාවිත කරමින් පෞද්ගලික ප්‍රතිලාභ ලබාගැනීම සඳහා යම් සංගම්වලට සම්බන්ධවීම හෝ සංගම් නිර්මාණය කිරීම නොකළ යුතු ය.

3. **නිල මුද්‍රාව/ලිපි ශීර්ෂය**

සාමදාන විනිශ්චයකාරවරයකු විසින්, මුද්‍රාව සහ ලිපි ශීර්ෂය, දෘඩ පිටපතක් වුව ද, විද්‍යුත් පිටපතක් වුව ද, ස්වකීය ලියාපදිංචි අංකය එහි සඳහන් කළ යුතු අතර රාජ්‍ය ලාංඡනය භාවිතා නොකළ යුතු ය.

4. **නාම පුවරු**

සාමදාන විනිශ්චයකාරවරයකුට තමා ඒ ධුරයේ සේවා ඉටුකරන බවට දැනුම්දීම සඳහා, අවස්ථාචෝචිත පරිදි දෘඩ පිටපතකින් හෝ විද්‍යුත් පිටපතකින් ඇති ව්‍යාපාර කාඩ්පත්වල හෝ ලිපි ශීර්ෂවල ස්වකීය නමට පසුව විරුද නාමය භාවිත කිරීම ඇතුළුව සිය කාර්යාලයේ හෝ පදිංචි ස්ථානයේ සාමදාන විනිශ්චයකාර නාම පුවරු ප්‍රදර්ශනය කිරීම සිදුකළ හැකි ය.

5. **නිවේදනය**

(අ) සාමදාන විනිශ්චයකාරවරයකු විසින්, පහත දැක්වෙන යම් වෙනසක් ඇතිවීමෙන් පසුව, හැකි ඉක්මනින් ඒ පිළිබඳව ලිඛිතව ලේකම්වරයා වෙත දැනුම් දිය යුතු ය.

(i) සාමදාන විනිශ්චයකාරවරයාගේ නමේ වෙනසක්,

(ii) පදිංචි ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක්,

(ආ) සියලුම සාමදාන විනිශ්චයකාරවරුන් විසින් ස්වකීය අභාවය පිළිබඳ ග්‍රාම නිලධාරිවරයා හරහා ලිඛිතව ලේකම්වරයා වෙත හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීම සඳහා පවුලේ සමීපතම ඥාතීන් දැනුවත්කර තිබිය යුතු ය.

EOG - 11-0317

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.